කළුතර නගර සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1:3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1:3:1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු එකතු කළ අගයමත(VAT) බදු මුදල ලෙජර් ගිණුම අනුව රු.115,437 ක් වුවත් අවසන් ගිණුමෙහි එය රු.102,543 ක් ලෙස දැක්වීම හේතුවෙන් ගෙවිය යුතු එකතු කළ අගයමත (VAT) බදු රු.12,894 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන තිබූ රු.249,600 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් රු. 249,600 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.303,310 ක් වූ ණයහිමියෝ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ණයහිමියෝ හා වර්ෂයේ වියදම රු.303,310 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිළදී ගත් රු.11,800 ක් වටිනා විදුලි කේතල දෙකක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වර්ෂ දෙකක් නොයික්මවූ තෝරාගත් ආදායම් ශේෂ 09 කට අදාළ රු.195,000 ක් ආදායමට ගැනීමට කටයුතු කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන ආධාර රු.3,470,236 ක් හා ප්‍රාග්ධන වියදම් රු.3,470,236 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළව මුද්දර ගාස්තු සඳහා බිල් කිරීමක් කර නොතිබුණ අතර පෙර වර්ෂවලට අදාළව ප්‍රවර්තන වර්ෂයේ ලැබුණු රු.33,192,572 ක මුදල වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.8,025,689 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.6,022,477 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1:3:3 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අත්තිකාරම් ලේඛනය, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා විස්තරාත්මක උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.31,563,228 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1:3:4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) නගර සභා ආඥා පනත (255 අධිකාරය) 145 (2) (1) වගන්තිය | | යටත් පිරිසෙයින් වර්ෂ 3 කට වරක්වත් තක්සේරුගත බදුකුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 145 (1) (ආ) වගන්තිය | | බදු ගිවිසුමේ කොන්දේසිවලට හා එහි නියම කර ඇති කුලිය ගෙවීමට යටත්ව සහා වෙළඳසැලක වෙළඳාම් කිරීමට හැකි වුවත් ඒ අනුව කටයුතු නොකළ වෙළඳසැලක් නිරීක්ෂණය විය. |
| 145 (4) (1) හා 136 (අ) වගන්ති | | සභා වෙළඳසැල් සම්බන්ධයෙන් බදු කොන්දේසි පැහැර හැරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම හා එකී වෙළඳසැල්වලට අදාළ සනීපාරක්ෂක පහසුකම් සැලසීම සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ.104 (1) | | වොල්වෝ වර්ගයේ ගිනි නිවීමේ රථයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2001 අගෝස්තු 08 දිනැති අංක 15/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් නොසලකා පැමිණීමේ හා පිටවීමේ ලේඛණය පදනම් කරගෙන අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | | සභාව සතු වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. |
| (ඉ) පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/13/2016 චක්‍රලේඛය | | අතුරු බදු දීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,467,270 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,650,545 ක් විය.

2:2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් බදු | 26,783,000 | 28,689,048 | 33,724,921 | 14,091,195 | 26,830,000 | 27,937,451 | 34,410,644 | 19,354,776 |
| (ii) කුලී | 6,600,000 | 7,348,457 | 7,120,244 | 534,935 | 11,650,000 | 6,960,435 | 7,823,426 | 1,033,533 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,000,000 | 334,155 | 334,155 | - | 100,300 | 637,894 | 637,894 | - |
| (iv) වෙනත් ආදායම් - තානායම් කුලී | 500,000 | 515,775 | 313,763 | 287,974 | 420,000 | 472,794 | 931,769 | 42,981 |

2.2.2 වරිපනම් හා බදු

(අ) වරිපනම්

i. සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.18,614,199 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.10,308,484 ක් හෙවත් සියයට 55 ක් අයකරගෙන තිබුණි.

ii. සමාලෝචිත වර්ෂයට වරිපනම් බිල්කිරීම් රු.22,329,294 ක් වූ අතර වර්ෂය තුළදි ඉන් රු.16,839,144 ක් හෙවත් සියයට 75 ක් අයකරගෙන තිබුණි.

iii. 2017 දෙසැම්බර් 31 දිනට හිඟය රු.13,795,865 ක් වූ අතර ඉන් රු.8,305,715 ක් පෙර වර්ෂවලට අදාළ හිඟ ශේෂ විය. දිර්ඝ කාලීනව පවතින හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

iv. සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි.

(ආ) විනෝද බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ විනෝද බදු ආදායම රු.511,869 ක් වූ අතර වාර්ෂික බිල් කිරීම් රු.4,175,375 ක් විය. වර්ෂයේ ලැබීම් රු.4,391,915 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.295,329 ක් විය.

2.2.3 කුලී

(අ) කඩකුලී

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.194,458ක කඩ කුලී හිඟයක් පැවති අතර වර්ෂය තුළදී ඉන් රු.167,458 ක් හෙවත් සියයට 86 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ කඩ කුලී බිල් කිරිම් රු. 6,531,662 ක් වූ අතර ඉන් රු. 6,311,702 ක මුදලක් වර්ෂය තුළ අය කර තිබීම නිසා තව දුරටත් අය කිරිමට ඇති ශේෂය රු. 219,960 ක් විය. ඒ අනුව වර්ෂයට අදාළ කුලිය වර්ෂය තුළදී අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(iii) සාරානන්ද මාවතේ සභාව සතු පොළ කඩ 110 ක් ලේඛන ගත වී තිබූ නමුත් ඉන් කඩ කීපයක ඒ සඳහා වෙන්කළ භූමිය පමණක් තිබුණි. වසා තිබූ කඩ 24 න් කඩ කීපයක අනවසර පදිංචිකරුවන් රැඳී සිටින බව හා විවෘත කර ඇති කඩ කාමර 54 ක් උපබදු දී ඇති බව නිරීක්ෂණය විය.

(iv) සමාන කඩ කාමර 36 කින් සමන්විත තුරු සෙවණ වෙළඳකුටි සංකීර්ණයේ කඩ කාමර 14ක් උපබදු දී තිබූ අතර වසරකට වැඩි කාලයක සිට කඩ 4 ක් වසා දමා තිබුණි. කඩ 3 ක් සඳහා 2017 වර්ෂයට බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(v) ගබඩා පාර වෙළඳසැල් 13 ප්‍රථම වරට බදුකරුවන් වෙත ලබාදීමේදී ගිවිසුමේ වලංගු කාලය සඳහන්ව නොතිබීම නිසා එකී ගිවිසුම් අළුත්කර ගාස්තු සංශෝධනය කිරීමට නොහැකි වී තිබුණු අතර එක් කඩ කාමරයකින් පමණක් හිඟ කුලී අයවිය යුතුව තිබුණි.

(vi) කළුතර උතුර පොළ භූමියේ ඇති නව සාප්පු සංකීර්ණයේ ඇති කඩ කාමර 8 න් 4 ක් උපබදු දී තිබූ අතර කඩ 2 ක් දිගු කලක සිට වසා දමා තිබුණි. 2001, 2002 හා 2003 වසරවලදී ප්‍රථම වරට බදු දී තිබූ මෙම වෙළඳ සැල් වල බදු ගිවිසුම් 2017 වර්ෂය දක්වා අළුත් කිරීමට කටයුතු කර නොතිබූ අතර මාසික කුලියද සංශෝධනය කර නොතිබුණි.

(vii) බඩු ගබඩා පාර නව වෙළඳ සංකීර්ණයේ වූ කඩ කාමර 53 බදු දීම සඳහා ප්‍රථම වරට ගිවිසුම් ගත වීමේදී ගිවිසුමේ කාලය දක්වා නොතිබුණු අතර එකී කඩ කාමර බොහොමයක් අතුරු බදු දී තිබුණි. මෙකී කඩ කාමරවල බදු ගැණුම්කරු මියගිය විටක බදු අයිතිය වෙනස් කිරීමට කටයුතු නොකළ අවස්ථා, කඩ කාමර වෙනස් කළ අවස්ථා හා වසා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(viii) නව සාප්පු සංකීර්ණ බිම් මහලේ ඇති කඩ කාමර 10 කට අදාළව 1986 වර්ෂයේදී ප්‍රථම වරට බදු ගිවිසුම් අත්සන් කර තිබුණද 2017 වර්ෂය දක්වා එකී ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබූ අතර එක් කඩ කාමරයක් උපබදු දී තිබුණි.

(ix) කටුකුරුන්ද වෙළඳපල කඩ කාමර සඳහා බදු ගිවිසුම්වලට ඇතුළත් වීමේදී ගිවිසුම් කාලය දක්වා නොතිබීම නිසා එකී ගිවිසුම් 2017 වර්ෂය දක්වා අළුත් කර නොතිබුණු අතර කඩ කාමර 3 ක් දිගුකලක සිට වසා තිබුණි.

(ආ) බදුකුලී

බාහිර පාර්ශවයන් වෙත බදු දී තිබූ ඉඩම් කොටස් 4 ක් සඳහා 2007 වර්ෂයේ සිට බදුකුලී සංශෝධනය වී නොතිබුණු අතර එකී බදුකරුවන් 2017 වර්ෂය සඳහා බදු මුදල් ගෙවා නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු බිල්කිරීමක් සිදුකර නොතිබුණ අතර වර්ෂයට අදාළ උපලේඛන පිළියෙල කර ගෙන්වා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

නගර සභා ආඥා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 4 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි සඳහන් නොවූ ප්‍රාග්ධන වැය යටතේ සභා කර්මාන්ත 19 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.18,072,357 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

2017 වර්ෂය සඳහා කසළ කළමනාකරණය වෙනුවෙන් සභාව විසින් රු.65,469,131 ක වියදමක් දරා තිබූ අතර එකී වියදම් පියවා ගැනීමට හෝ අවම කර ගැනීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. සභාව විසින් කසළ බදු පැනවීමක් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ කසළ බදු වශයෙන් අයකරගෙන තිබුණේ රු.403,000 ක් පමණක් වූ අතර කසළ බැහැර කරන භූමිය සඳහා පරිසර බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි.

(ඈ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) <u>මහජන සුභ සාධන අරමුණු නිසි ලෙස ඉටු නොවීම</u>

සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් 03ක ශේෂය රු.41,981,926 ක් විය. තවද, රු. මිලියන 63 ක ස්ථාවර තැන්පතු පැවතුණි. ඊට අමතරව රු.52,640 ක ඉතිරිකිරීම් විය. මේ අනුව සභාවේ මූල්‍ය තත්වය යහපත් මට්ටමක පැවති නමුත් සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කර ඇති ප්‍රාග්ධන ව්‍යාපෘති ගණන 19 ක් වූ අතර එහි ඇස්තමේන්තු වටිනාකම රු.18,072,357 ක් විය. සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක සභාවේ බලතල කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ බලධාරියා ලෙස ලේකම් විසින් මහජන ඉල්ලීම්, යෝජනා, අදහස් ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වුවත් එවැන්නක් සමාලෝචිත වර්ෂයේදී නොවීම නිසා මහජනයාගේ සුභසාධන අරමුණු ඉටුකිරීමේ වගකීම නිසි ලෙස ඉටුව නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

<u>ගිණි නිවීමේ සේවා ඒකකයේ සේවාවන් හා ආදායම් රැස්කිරීම</u>

(අ) නගර සභා බල ප්‍රදේශයෙන් පිටත ගිණි නිවන සේවා සැපයීම, අළුතින් ඉදිකරන ගොඩනැගිලි සඳහා ගිණි අවදානම් නිවාරණ සහතික ලබාදීම, ගොඩනැගිලි සැලසුම් සහ ගිණි ආරක්ෂණ පද්ධති සහතික කිරීම, ගිලන්රථ සේවා සැපයීම යනාදී කටයුතු වෙනුවෙන් අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගෙන ගාස්තු අයකිරීමේ ක්‍රමවේදයක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ගිලන්රථ සේවාව සභා තීරණයක් මත ගාස්තු අය කිරීමේ පදනම මත ක්‍රියාත්මක කර තිබූ නමුත් අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර නොගැනීම හේතුවෙන් 2016 හා 2017 වර්ෂවලදී එම සේවාවන් අත්හිටුවා තිබුණි.

(ඇ) වටිනාකම රු.51,000,000 ක් වූ ගිනි රථයේ රක්ෂණ වාරිකය 2015 වර්ෂයේදී රු.625,378 ක් ද, 2016 වර්ෂයේදී රු.556,943 ක් ද වූ අතර 2017 වර්ෂයේදී වාහනයේ වටිනාකමෙන් සියයට 10 කට හෙවත් රු.5,100,000 කට රක්ෂණය කිරීම හේතුවෙන් රක්ෂණ වාරිකය රු.42,607 ක් වී තිබුණි. රක්ෂිත වටිනාකම අඩු කිරීම නිසා වාහනයට යම්කිසි හදිසි අනතුරක් සිදු වුවානම් සම්පූර්ණ අලාභය අයකර ගැනීමට නොහැකි වන බව නිරීක්ෂණය කෙරේ.

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) ලේකම් තනතුරේ වැඩ ආවරණය කිරීමට කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ නිලධාරිනියක පත්කර තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 අනුව ස්ථිර කරන ලද සේවකයින් 06 දෙනෙකු ප්‍රාථමික අංශයේ තනතුරු සඳහා අනුයුක්ත කරගෙන තිබුණත් මෙම සේවකයින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ද්විතියික කාර්ය මණ්ඩලයේ තනතුරු 09 ක් සඳහා නිලධාරීන් 19 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුන අතර ප්‍රාථමික කාර්යය මණ්ඩලයේ තනතුරු 08 ක් සඳහා නිලධාරීන් 16 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(ඇ) ව්‍යාපෘති පදනම මත තනතුරු 04 ක් සඳහා නිලධාරීන් 13 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

(අ) 2015 ජනවාරි 01 සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලංකා බැංකු ජංගම ගිණුමක රු.4,541,754 ක මුදලක් රඳවාගෙන තිබුණි. මෙම මුදල 10% කාලීන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණිනම් රු.450,000 කට අධික පොලී ආදායමක් ලබා ගැනීමට ඉඩකඩ තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සභාව වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වාහන තුනක් ලියාපදිංචි කිරීමකින් තොරව වසර කිහිපයක සිට පාවිච්චියට නොගෙන රථවාහන අංගනයේ ගාල් කර තිබුණි.

3.4.2 වාහන උපයෝජනය

සභාව සතු වාහන 07 ක මයිලෝ මීටරය අක්‍රියවී තිබූ අතර වාහන සඳහා නඩත්තු කරනු ලබන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි. ආදායම් බලපත්‍ර ලබා නොගත් හා මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි නොකරන ලද වාහන 4 බැගින් වූ අතර නියමිත දිනට ආදායම් බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු.10,280 ක දඩ මුදලක් ගෙවීමට සිදුව තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් සියයට 7 සිට සියයට 86 දක්වා හා වියදම් සියයට 4 සිට සියයට 57 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | ගිණුම්වලින් අත්හැරීම්, අඩුවෙන් හා වැඩියෙන් සටහන් වීම් තිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | | හිඟ ආදායම් අයවීම් ප්‍රමාණවත් මට්ටමක නොතිබීම |
| (ඇ) | අයවැය පාලනය | i. | අයවැය ගත හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම. |
| | | ii. | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාහන පාලනය | i. | මයිලෝ මීටර් අක්‍රිය වී තිබීම. |
| | | ii. | ලොග් පොත් යාවත්කාලීන නොකිරීම. |
| | | iii. | ආදායම් බලපත්‍ර ලබා නොගැනීම. |
| | | iv. | සමීක්ෂණ මණ්ඩල විසින් නිර්දේශකළ අපහරණයන් සිදු නොකිරීම. |
| (ඉ) | සේවක කළමනාකරණය | i. | කාර්ය මණ්ඩලය විධිමත් කර නොගැනීම. |
| | | ii. | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |